00062

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/23
4 වන මට්ටම
**AFU4507** - සාර්ව ආර්ථික විද්‍යාව
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය : අගෝස්තු 2023
කාලය - පැය දෙක (02)යි.

---

දිනය - 2023.08.20 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30

---

විභාග අංකය - ---------------------------

පිළිතුරු පත්‍රය ( බහුවරණ ප්‍රශ්න සඳහා)

සපයා ඇති පිළිතුරු හතර අතරින්, තෝරාගත් පිළිතුරට අදාල අංකය පමණක් සඳහන් කරන්න.
එක් ප්‍රශ්නයක් සඳහා අදාල කොටුවේ එක් පිළිතුරකට වඩා සඳහන් කර ඇත්නම් ලකුණු ලබා නොදේ.
මෙම පිළිතුරු පත්‍රය ඔබගේ පිළිතුරු පොතෙහි අමුණන්න.

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |
| 11. | |
| 12. | |
| 13. | |
| 14. | |
| 15. | |
| 16. | |
| 17. | |
| 18. | |
| 19. | |
| 20. | |

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධි වැඩසටහන 2022/23
4 වන මට්ටම
**AFU4507** - සාර්ව ආර්ථික විද්‍යාව
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය : අගෝස්තු 2023
කාලය - පැය දෙක (02)යි.

---

දිනය - 2023.08.20 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30

---

උපදෙස් :
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
I - කොටස - බහුවරණ ප්‍රශ්න සහ II වන කොටස - රචනා ප්‍රශ්න

I වන කොටස සඳහා උපදෙස් -

- 1 කොටසෙහි බහුවරණ ප්‍රශ්න 20 ක් අන්තර්ගත වන අතර, ඒ සඳහා ලකුණු 40 ක් ලැබේ. (ලකුණු 02 x 20 = 40)
- බහුවරණ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න අංක සහිතව පිළිතුරු පත්‍රයක් සපයා ඇත. එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති විකල්ප පිළිතුරු හතරෙන් නිවැරදි පිළිතුරෙහි අංකය අදාල ප්‍රශ්ණ අංකය ඉදිරිපිට කොටුවෙහි පැහැදිලිව සඳහන් කරන්න.
- එම බහුවරණ ප්‍රශ්න සඳහා වූ පිළිතුරු පත්‍රයේ, ඔබගේ විභාග අංකය, ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයෙහි සඳහන් කරන්න.
- බහුවරණ ප්‍රශ්න සඳහා ලකුණු කල පිළිතුරු පත්‍රය , ඔබගේ පිළිතුරු පොතෙහි අමුණන්න.

---

## I - කොටස - බහුවරණ ප්‍රශ්න

01. පහත සඳහන් දෑ අතරින් සාර්ව ආර්ථික විද්‍යාව යටතේ හදාරන්නේ කුමක් ද?

    i. තිබෙන විකල්ප හමුවේ, පුද්ගලයන් තෝරා ගැනීම් කරනු ලබන්නේ කෙසේ ද?
    ii. භාණ්ඩයක් නිෂ්පාදනයේ දී, ආයතනයක් විසින් ප්‍රාග්ධනය සහ ශ්‍රමිකයන් සංයෝජනය කරන්නේ කුමන ආකාරයෙන් ද?
    iii. විවිධ භාණ්ඩයන්ගේ මිල තීරණය කරන්නේ කෙසේ ද?
    iv. විරැකියාව ඇතිවීමට මූලික වූ හේතූන්

02. ආර්ථිකයක සමස්ත වියදමෙහි අන්තර්ගත වන්නේ,

    i. පරිභෝජන සහ ආයෝජන වියදම්
    ii. පරිභෝජන,ආයෝජන සහ පෞද්ගලික වියදම්
    iii. පරිභෝජන, ආයෝජන වියදම් සහ රජයේ සංක්‍රාම වියදම්
    iv. පරිභෝජන, ආයෝජන , රජයේ වියදම් සහ ශුද්ධ අපනයන (Net exports)

03. රටක ආර්ථිකය උත්තේජනය කර ආර්ථික වර්ධනය ලඟාකර ගැනීමට වඩාත් ම ඵලදායී මාර්ගය වනුයේ,

i. බදු වැඩිකර, රජයේ වියදම් අඩු කිරීමෙන්
ii. බදු අඩුකර, රජයේ වියදම් වැඩි කිරීමෙන්
iii. බදු සහ රජයේ වියදම් යන දෙකම අඩු කිරීමෙන්
iv. බදු සහ රජයේ වියදම් යන දෙකම වැඩි කිරීමෙන්

04. පහත සඳහන් දෑ අතුරින්, ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය ලෙස සැලකිය හැක්කේ කුමක් ද?

i. වාණිජ බැංකුවල පවත්වාගත යුතු සංචිත ප්‍රමාණය වැඩි කිරීම.
ii. අන්තර් බැංකු පොලී අනුපාතය වැඩි කිරීම.
iii. අන්තර් බැංකු පොලී අනුපාතය අඩු කිරීම.
iv. දැඩි ණය දීමේ ප්‍රතිපත්ති හඳුන්වා දීම.

05. ස්වායත්ත පරිභෝජන වියදම් යනුවෙන් හඳුන්වන්නේ,

i. ආදායම ශූන්‍ය මට්ටමේ දී, පරිභෝජනය සඳහා දරණ වියදම්
ii. පරිභෝජනය සඳහා දරණ මුළු වියදම.
iii. වෙනස් වන ආදායමට සාපේක්ෂව, වෙනස් වන පරිභෝජන වියදම්
iv. ඉහත සඳහන් කිසිවක් නිවැරදි නොවේ.

06. පහත සඳහන් දෑ අතුරින්, සංක්‍රාම වියදම් ලෙස සැලකිය හැක්කේ කුමක් ද?

i. රාජ්‍ය දෙපාර්තමේන්තුවක සේවය කරන නිලධාරියෙකුට ගෙවන වැටුප.
ii. විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයකුට ගෙවන විශ්‍රාම වැටුප.
iii. රජය සඳහා ලබාදුන් සේවාව වෙනුවෙන්, පෞද්ගලික ආයතනයකට කරන ලද ගෙවීම.
iv. දේශීය අධිකාරියක සේවකයන් සඳහා කරන ලද දීමනාවන්.

07. ආර්ථිකයක් සම්බන්ධව පහත දී ඇති කරුණු සලකන්න.

ස්වායත්ත පරිභෝජන වියදම් = රුපියල් මිලියන 124
ආන්තික පරිභෝජන නැම්යාව (MPC) = 0.8,

මෙම ආර්ථිකයේ ඉතුරු කිරීම් ශ්‍රිතය වනුයේ,

i. S = 124 + 0.8 Yd    ii. S = 124 + 0.2 Yd
iii. S = -12y + 0.8 Yd    iv. S = -12y + 0.2 Yd

08. ස්වායත්ත පරිභෝග වියදම = රුපියල් බිලියන 88 , සහ ආන්තික ඉතුරු කිරීම් නැම්යාව (MPS) = 0.3 වන ආර්ථිකයක, පුද්ගලයකුගේ වියදම්කළ හැකි ආදායම රුපියල් 4000/= ක් වන විට, එහි පරිභෝජන වියදම වනුයේ,

i. රුපියල් බිලියන 2888    ii. රුපියල් බිලියන 1112
iii. රුපියල් බිලියන 2400    iv. රුපියල් බිලියන 3912

09. රජය විසින් බදු එකතු කරනු ලබන සහ සංක්‍රාම වියදම් ලබාදෙන ආර්ථිකයක, වියදම් කල හැකි ආදායම ගණනය කල යුත්තේ,

i. $Y_d$ = ආදායම - බදු - සංක්‍රාම වියදම්  ii. $Y_d$ = ආදායම + බදු + සංක්‍රාම වියදම්

iii. $Y_d$ = ආදායම - බදු  iv. $Y_d$ = ආදායම - බදු + සංක්‍රාම වියදම්

10. පහත සඳහන් දෑ අතුරින් ආර්ථිකයක ආදායම් චක්‍රිය ප්‍රවාහයට විදීමක් (injection) ලෙස සැලකිය හැක්කේ කුමක් ද?

i. ආනයන සඳහා දරණ වියදම්  ii. රජයේ ඇයවැය හිඟය

iii. ඉතුරු කිරීම් ප්‍රමාණය  iv. රජයේ බදු අනුපාතය වැඩිවීම.

11. පහත දක්වා ඇති දෑ අතුරින්, දළ දේශීය නිෂ්පාදනය (GDP) සහ දළ ජාතික නිෂ්පාදනය (GNP) අතර සම්බන්ධය නිවැරදිව දක්වන්නේ කුමකින් ද?

i. GDP = GNP + විදේශීය ශුද්ධ සාධක ආදායම (NFIA)

ii. GDP = GNP + සාධක ආදායම් ලැබීම් ( Factor income receipts)

iii. GNP = GDP + සාධක ආදායම් ලැබීම් ( Factor income receipts)

iv. GNP = GDP + විදේශීය ශුද්ධ සාධක ආදායම

**පහත දක්වා ඇති අංශ තුනක ආර්ථිකයක විස්තර උපයෝගී කර ගනිමින්, අංක 12,13, 14 සහ 15 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ප්‍රමාණය රුපියල් බිලියන වලින් දක්වා ඇත.)**

**පරිභෝජන ශ්‍රිතය (C) = 112 + 0.8 Yd ;ස්වායත්ත ආයෝජන (I) = 100**

**ස්වායත්ත රජයේ වියදම් (G) = 108**

12. මෙම ආර්ථිකයේ සමතුලන අවස්ථාවේ ජාතික ආදායම වනුයේ,

i. රුපියල් බිලියන 400  ii. රුපියල් බිලියන 1600

iii. රුපියල් බිලියන1680  iv. රුපියල් බිලියන 1720

13. මෙම ආර්ථිකයේ ඉතුරුම් ප්‍රමාණය වනුයේ,

i. රුපියල් බිලියන 208  ii. රුපියල් බිලියන 480

iii. රුපියල් බිලියන 1392  iv. රුපියල් බිලියන 710

14. මෙම දී ඇති ආර්ථිකයේ වියදම් සංගුණකය වනුයේ

i. 4  ii. 1.25  iii. 5  iv. 2

15. එම ආර්ථිකයට රජය විසින් ස්වායත්ත බදු රුපියල් බිලියන 10 ක් (T = 10) පනවයි නම්, එහි සමතුලිත අවස්ථාවේ ජාතික ආදායම,

i. රුපියල් බිලියන 40 ක් පහළ යයි.  ii. රුපියල් බිලියන 40 ක් ඉහළ යයි.

iii. එලෙසම පවතී.  iv. රුපියල් බිලියන 10 ක් පහළ යයි.

16. පහත සඳහන් ප්‍රකාශයන් අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. ආන්තික පරිභෝජන නැම්යාව (MPC) අඩුවන විට, වියදම් සංගුණකය ඉහළ අගයක් ගනී.
ii. ආන්තික ඉතුරුකිරීම් නැම්යාව (MPS) වැඩිවන විට, වියදම් සංගුණකය ඉහළ අගයක් ගනී.
iii. ආර්ථිකයක වියදම් සංගුණකය සහ ආන්තික ඉතුරුම් නැම්යාව(MPS) අතර සම්බන්ධයක් නැත.
iv. ආන්තික පරිභෝජන නැම්යාව (MPC) වැඩිවන විට, වියදම් සංගුණකය ඉහළ අගයක් ගනී.

17. පහත සඳහන් ප්‍රකාශයන් අතරින් වැරදි ප්‍රකාශය කුමක් ද?
i. ගනුදෙනු චේතනාව සඳහා වන මුදලේ ඉල්ලුම සහ ආදායම අතර සෘණ සම්බන්ධයක් පවතී.
ii. ගනුදෙනු චේතනාව සඳහා වන මුදල් ඉල්ලුම සහ ආදායම අතර ධන සම්බන්ධයක් පවතී.
iii. සමපේක්ෂණ චේතනාව සඳහා වන මුදලේ ඉල්ලුම සහ පොලී අනුපාතය අතර සෘණ සම්බන්ධයක් පවතී.
iv. ආරක්ෂණ චේතනාව සඳහා වන මුදලේ ඉල්ලුම සහ ආදායම අතර ධන සම්බන්ධයක් පවතී.

18. "IS" වක්‍රයට සෘණ බෑවුමක් තිබීමට හේතු සාධකය වනුයේ,

i. සමපේක්ෂණ චේතනාව සඳහා වන මුදලේ ඉල්ලුම සහ පොලී අනුපාතය අතර සෘණ සම්බන්ධයක් පැවතීම.
ii. ආයෝජන වියදම් සහ පොලී අනුපාතය අතර සෘණ සම්බන්ධයක් පැවතීම.
iii. බෑවුම තීරණය කරන්නේ ස්වායත්ත අයෝජන මත වීම.
iv. එම වක්‍රය දිගේ ඉතුරු කිරීම් සහ ආයෝජන සමතුලිත වීම.

19. මුදල් සඳහා වන ඉල්ලුම පොලී අනුපාතය මත කිසිසේත් රඳා පවතින්නේ නැති විටක, එය ආදායම මත පමණක් රඳා පවතින විට,
i. IS වක්‍රය සිරස් වේ. (පූර්ණ අනම්‍ය)
ii. IS වක්‍රය තිරස් වේ. (පූර්ණ නම්‍ය)
iii. LM වක්‍රය සිරස් වේ. (පූර්ණ අනම්‍ය)
iv. LM වක්‍රය තිරස් වේ. (පූර්ණ නම්‍ය)

20. ද්‍රවශීලතා උගුල යටතේ
i. පොලී අනුපාතය ඉතා පහල බැවින්, මුදල් අත තබා ගැනීමෙන් ඇතිවන ආවස්ථික පිරිවැය ශුන්‍ය වේ.
ii. පොලී අනුපාතය ඉතා ඉහල බැවින්, මුදල් අත තබා ගැනීමෙන් ඇතිවන ආවස්ථික පිරිවැය ඉතා අධික වේ.
iii. පොලී අනුපාතය ඉතා ඉහල බැවින්, ඉතුරුම් ප්‍රමාණය ඉහල යයි.
iv. පොලී අනුපාතය එලෙසම පවතින බැවින්, ආයෝජන වියදම් ප්‍රමාණය ද වෙනසක් සිදු නොවී එලෙස ම පවතී.

## II කොටස

සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ. (ලකුණු 30 බැගින්)

### ප්‍රශ්න අංක 01.

අ. i. ජාතික ආදායම (National Income) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. රටක ජාතික ආදායම ගණනය කිරීමේ දී භාවිත කරන ක්‍රමවේදයන් තුන කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. රටක ජාතික ආදායම ගණනය කිරීමේ දී පවතින සීමාවන් කවරේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 07)

ආ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පසුබෑම් රාශියකට මුහුණ දී සිටියි. අධික උද්ධමනය, අවප්‍රමාණය වන දේශීය මුදලේ අගය, ඍණ ආර්ථික වර්ධනය, ඉහළ පොලී අනුපාතය, මින් සමහරකි. මෙම තත්වයන් ව්‍යාපාර සහ අයෝජන පරිසරයට බලපාන්නේ කෙසේ ද? ව්‍යාපාර කළමනාකරුවකු ලෙස මෙම අහිතකර තත්වයෙන් මිදීම සඳහා ඔබ ඉදිරිපත් කරන පියවර කවරේ ද? උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 15)

### ප්‍රශ්ණ අංක 02

අ. i. LM වක්‍රයට ධන බෑවුමක් පවතින්නේ මන් ද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. රූප සටහන් උපයෝගී කර ගනිමින්, "අර්ධ තෙරපුම් ප්‍රතිවිපාකය" සහ "පූර්ණ තෙරපුම් ප්‍රතිවිපාකය" අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ. IS/LM රාමුව භාවිත කරමින්, ආර්ථිකයක පොලී අනුපාතයට සහ ආදායමට පහත සඳහන් වෙනස්වීම් බලපාන ආකාරය පැහැදිලි කරන්න.

i. රජය විසින් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම.

ii. මධ්‍යම බැංකුව විසින්, වාණිජ බැංකුවල පවත්වා ගතයුතු සංචිත ප්‍රමාණය වැඩි කිරීම.

iii. රජයේ බැඳුම්කර සහ සුරැකුම්පත් , මධ්‍යම බැංකුව විසින් මහජනතාවගෙන් ආපසු මිලදී ගැනීම.

iv. රජය විසින් බදු අනුපාතය වැඩි කිරීම.

v. ආර්ථිකයක සාමාන්‍ය මිල මට්ටම පහළ යාම. (ලකුණු 15)

හිමිකම් ඇවිරිණි.